# විකෘති විවාද විනාශයට පත් කළ විජයග්‍රහණය



One can fool all of the people some of the time and some of the people all of the time. But none can fool all of the people all of the time.

ඉහත කී කියමන බටහිර චින්තකයන් කිහිප දෙනෙකුට බැර කර තිබේ. එක්සත් ජනපදයේ කීර්තිමත් ජනපති ඒබ්‍රහම් ලින්කන් ද මෙයින් එක් කෙනෙකි. එයින් කියවෙන්නේ යමෙකුට සියලු දෙනා සෑම විටත් සෑම දෙනා ටික කලකටත් මුලා කළ හැකි වුවද, කිසිවෙකුට සියලු දෙනා සදහටම රැවටිය නොහැකි බවය.

1936 පාසල් ශිෂ්‍ය වියෙහි පටන් ශ්‍රී ලංකාවේ පැවැත්වුණු සෑම මැතිවරණයක් කෙරෙහි ම මම උනන්දුවෙන් අවධානයට යොමු කළෙමි. 1970 මැතිවරණය පවතිද්දී පමණක් මම දිවයිනෙන් බැහැර ව සිටියෙමි.

මේ සියලුම මැතිවරණවලට වඩා පසුගිය අඟහරුවාදා අවසාන වූ ජනාධිපතිවරණ විශේෂිත වූ බව සඳහන් කරන්නේ කනගාටුවෙනි. මා එසේ කියන්නේ අන් සියලු මැතිවරණවලදීට වඩා මේ මැතිවරණයේදී පදනමක් නැති බොරු දිගට හරහට ප්‍රචාරය වූ නිසාය.

## බොරු ප්‍රචාර

මෙහිදී ජනාධිපති කඳවුරට බොරු ප්‍රචාරය කිරීමට අවශ්‍ය වූයේ මඳ වශයෙනි. එසේ කළේ නැත්තේද නොවේ. එහෙත් ජනාධිපතිවරයාගේ දැවැන්ත ප්‍රතිරූපයට අමතරව විපක්ෂයේ පොදු අපේක්ෂකයාට එරෙහිව යොදා ගැනීමට ගෙවී ගිය හත් මාසය තුළ ඔහු කළ පරස්පර විරෝධී ප්‍රකාශ හා පදනමක් නැති චෝදනා වාර්තාගත වී හා තැටිගත වී තිබුණු නිසාය. එමනිසා ජනාධිපති කඳවුරට අලුත් 'කඩු, කිණිසි හා මුනිස්සම්' අවශ්‍ය නොවීය. කඩිමුඩියේ ගොනු කර ගත් ඒකාබද්ධ විපක්ෂයට තිබුණේ ආයුධ දෙකක් පමණි. පළමුවැන්න, ඉහළ යන ජීවන වියදමයි. ජීවන වියදම වූ කලී 1947 පටන්ම සෑම මැතිවරණයකම විපක්ෂයේ ලොකුම අවිය වූ බව අපි දනිමු. 1949 අය වැය විවාදයේදී සෝමවීර චන්ද්‍රසිරි මොරටුවේ මන්ත්‍රී කිව්යා සභා ගැබ තුළ කවියක් කීවේය.

**මූණ සයකි අත් දොළසකි මයුරා පිට වාහනේ**
**රූණු රටේ පිහිටි කන්ද කදිර දේව රාජණේ**
**ලුණු මිරිස් හාල් සීනි මිල වැඩි කළ කාරණේ**
**වානු බැරිය දුරු කළ මැන යූඇන්පී පාලනේ**

1951 අය වැය විවාදයේදී ඔහු එබඳුම කවියක් කීවේය. එහි අග දෙපදය මට තවමත් මතකය.

**දුප්පත් මිනිහාට ගෙන දෙන පීඩනය**
**ඉලක්කම් ගොඩකි අය වැය ලේඛනය**

එදා පටන් සෑම අය වැය විවාදයකදීම ඒ ඒ කාලවල සිටි විපක්ෂය පවතින රජයට විරුද්ධව ගායනා කළේ ඔය සින්දුවමය.

## අසත්‍ය ප්‍රචාර

සෑම විපක්ෂයක්ම, සෑම මැතිවරණයකදීම පවතින රජයට විරුද්ධව ප්‍රචාරක අවියක් වශයෙන් 'බොරුව හා අපහාසය' ආයුධ කර ගත් සැටි අපි දුටුවෙමු. එහෙත් 1977 ට පෙර තම ප්‍රතිවාදියෙකුගේ පෞද්ගලික චරිතය පිළිබඳව අසත්‍ය ප්‍රචාර කිරීම මන්ත්‍රීධූරය අහිමි වීමට පවා හේතු වූ වරදකි.

ලංකා පාර්ලිමේන්තුවේ පළමුවන මැතිවරණයේදී මහනුවර ආසනය ජය ගත් ජෝර්ජ් ඊ ද සිල්වා ඇමැතිවරයාගේ ආධාරකරුවන් ඔහුගේ ප්‍රතිවාදියා වූ ටී.බී. ඉලංගරත්න මහතාගේ චරිතය ඝාතනය වන අන්දමේ අසත්‍ය චෝදනා ප්‍රචාරය කිරීම නිසා ද සිල්වා මහතාට අසුන අහිමි විය. දෙවයේ පුදුම සමච්චලයකට මෙන් අතුරු මැතිවරණයෙන් ජයගත් ඉලංගරත්න මහතාටද අසුන අහිමි වූයේ සිය ප්‍රතිවාදියා වූ ෆ්‍රෙඩී ඊ ද සිල්වා මහතාගේ චරිතය ඝාතනය වන අන්දමේ අසත්‍ය කරුණු අඩංගු පත්‍රිකාවක් ප්‍රචාරය කිරීමේ වරදටය.

මීට සාපේක්ෂව 2010 ජනාධිපතිවරණයේදී ජනාධිපති මහින්ද රාජපක්ෂ මහතාට අපහාස අවලාද හා නින්දා කරමින් විපක්ෂයේ ප්‍රධාන අපේක්ෂකයාගේ ආධාරකරුවන් පමණක් නොව එම අපේක්ෂකයාට කළ ප්‍රකාශයන් එකක්වත් සත්‍ය බවට ඔප්පු වන සාක්ෂි එකක්වත් නොමැත.

## බිහිසුණු සංග්‍රාමය

ජනාධිපති රාජපක්ෂ මහතා එම ධූරයට පත් වූයේ නොවැම්බර් මාසයේය. එතැන් පටන් ගත වූ 2005 වසර 4න් වසර තුනක් ම ඔහු කැප වූයේ මීට පෙර කිසිම රාජ්‍ය නායකයකුට කළ නොහැකි වූ ජාතික යුතුකමක් ඉටු කිරීමටය. එනම් ලෝකයේ ප්‍රබලම ත්‍රස්තවාදී සංවිධානයක් වූ කොටි සංවිධානය සමූල ඝාතනය කිරීමේ සටනටය. එය ඔහු සාර්ථක ව නිම කළේ 2009 මැයි මස 18 වැනිදාය. පුරා තුන් වසක් පැවැති එම බිහිසුණු සංග්‍රාමයේ දී ඔහුට නාවුක හමුදාපති වසන්ත කරන්නාගොඩ යුද හමුදාපති සරත් ෆොන්සේකා, ගුවන් හමුදාපති රොෂන් ගුණතිලක හා ජගත් ජයසූරිය, කමල් ගුණරත්න ශවේන්ද්‍ර සිල්වා හා ප්‍රසන්න සිල්වා යන සෙන්පතියන් ගෙන්ද, ඒ සියල්ලන්ටම වඩා යුද හමුදා නාවුක හමුදා හා ගුවන් හමුදා භටයන් දස දහස් ගණනකගේ කැප කිරීමද මහෝපකාරී වූ බව නොරහසකි.

එහෙත් යුද ජයග්‍රහණයෙන් මාස තුනක් පසුවෙත්ම අගෝස්තු මාසයේ සිට ජනාධිපතිවරයාට හා ඔහුගේ සහෝදරයන්ට ද, එල්ලවන්නට පටන් ගත්තේ පදනම් විරහිත, සාක්ෂි කිසිවක් නැති, දූෂණ හා භීෂණ චෝදනාවන්ය. මේ අභූත චෝදනා පතුරුවා හරින ලද්දේත් සංවිධානාත්මක ඕපදූප ප්‍රචාරවලිනි. මේ ප්‍රචාරයන්හි නායකත්වය දැරුවෝ විශ්‍රාමික ජනරාල් සරත් ෆොන්සේකා එජාප නායක රනිල් වික්‍රමසිංහ, ශ්‍රීලනිප මංගල පාර්ශවයේ

*සරත් ෆොන්සේකා මහතාගේ කතාවල වැඩිපුරම භාවිත කළ වචනය වූයේ දූෂණය හා හොරකමය. එහෙත් ඒ එකම දූෂණ ක්‍රියාවක් වත් ඔහු සවිස්තරව ඔප්පු කළේ නැත.*

නායක මංගල සමරවීර සහ ජනතා විමුක්ති පෙරමුණේ අනුර කුමාර දිසානායක යන මහත්වරුන්ය. මේ මහතුන්ගේ ප්‍රකාශ කිහිපයක් හුදී ජනයාගේ ප්‍රසාද සංවේගය උදෙසා අපි කිරා බලමු.

සරත් ෆොන්සේකා මහතාගේ කතාවල වැඩිපුරම භාවිත කළ වචනය වූයේ දූෂණය හා හොරකමය. එහෙත් ඒ එකම දූෂණ ක්‍රියාවක් වත් ඔහු සවිස්තරව ඔප්පු කළේ නැත. එහෙත් ඔහුට විරුද්ධව (සහ ඔහුගේ ඥාතියෙකුට විරුද්ධව ) ඉදිරිපත් වූ දූෂණ චෝදනා ගැන ඇසූ පමණින් ඔහු එම සවිස්තර චෝදනාවලට පිළිතුරු දෙනු වෙනුවට චෝදනාකරුට විරුද්ධව කලවැද්දා, පාහරයා හා අශික්ෂිතයා වැනි අපහාසාත්මක වචන පාවිච්චි කොට කර ඇරියේය.



ඉන්දියාවේ හිටපු නියෝජ්‍ය මහ කොමසාරිස්
ප්‍රවීණ මාධ්‍යවේදී
ඇස්.පියසේන

## වැරදුණු තැන

ඔහු මරදානේ සිය අන්තිම රැළිය අමතමින් කළ ප්‍රකාශයත් පාරාවළල්ලක් වී ඔහු වෙතටම කැරකුණේ මැතිවරණයට පෙරදින රාත්‍රියේදීය. අවසන් රැළියේදී ඔහු පැවසුවේ තමාගේ බෑණා ප්‍රශ්න කිරීම සඳහා අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවට කැඳවන ලෙස ආරක්ෂක අමාත්‍යංශය දුන් නියෝගය අපරාධ පරීක්ෂණ නිලධාරීන් ප්‍රතික්ෂේප කළ බවත්, එබඳු පහත් ක්‍රියා කිරීමට තමන් සූදානම් නැති බව පමණක් නොව එබඳු දේ කිරීමට වඩා නිල ඇඳුම ගලවා ගෙදර යාමට සූදානම් වන බවත් කී බවය.

ෆොන්සේකා මහතාට වැරදුණේ එතැනය. ජනාධිපති ධූර අපේක්ෂකයාගේ මේ අසත්‍ය ප්‍රකාශය තමන් පිළිකුළෙන් ප්‍රතික්ෂේප කරන බව කී අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ ප්‍රධානියා, සිදුවූ දේ විස්තර කළේ මෙසේය. "මා අතේ මේ තිබෙන්නේ ෆැක්ස් පණිවිඩයයි. ඒ ෆැක්ස් පණිවිඩයෙන් ධනුක තිලකරත්න මහතා පවසා ඇත්තේ තම මාමණ්ඩියගේ මැතිවරණ කටයුතු නිසා තමාට කාර්ය බහුල බැවින් අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවට පැමිණීමට ජනාධිපතිවරණයෙන් පසු දිනයක් ලබා දෙන ලෙසය. ඔහුගේ ඉල්ලීමට අප එකඟ වීම පමණයි සිදු වූයේ'

රනිල් වික්‍රමසිංහ මහතාගේ චෝදනාව ලක්ෂණ තාලයකට ඉදිරිපත් කෙරෙන්නෙකි. දූෂණයෙන් එක පවුලක්, රජ පවුලක් පෝෂණය වූයේ ජනතාවට භීෂණය පතුරවමින් ඔහුගේ සටන් පාඨයක් ද විය.

## කවුද හොරා

ඔහු "කවුද හොරා" කියන විට තෝරා ගත් අනුගාමිකයෝ "රාජපක්ෂ" කියා හඬ නගති. අවසානයේදී ඔහු මහින්ද රාජපක්ෂ පමණක් නොව තමාද දෙමළ කතා කරන්නට දන්නා බව ප්‍රදර්ශනය කරයි.
"පෝඩා.... මහින්ද.....
පෝඩා
පෝඩා.... බැසිල්.....
පෝඩා
පෝඩා.... රිෂාද්....
පෝඩා" කියමින් තවත් රැස්වීමක් බලා පිටත්ව යයි.

අනුර කුමාර දිසානායක ප්‍රමුඛ ජවිපෙ කණ්ඩායමේ කට කතා ප්‍රචාරය මීට වඩා වෙනස් විය. ඔවුහු වරින් වර රජයෙන් ඉවත් වී තම කඳවුරට පැමිණෙන මැති ඇමතිවරුන් ගැන ලැයිස්තු ඉදිරිපත් කරති. ඔවුන් ඒ ලැයිස්තු ඉදිරිපත් කළේ 'එන කට්ටිය දැක්කම තමයි. මේගොල්ලන්ට උණ විකාර හැදෙන්නේ' කියමිනි. මුළු රටම මවිතයට පත් කරන මේ ලැයිස්තුවට අන්තර්ගත නම් කිහිපයක් දෙස බලමු.

## ප්‍රතිචාරය

අගමැති, රත්නසිරි වික්‍රමනායක, ඇමැති මෛත්‍රීපාල සිරිසේන, ඇමැති නවීන් දිසානායක, ඇමති හේමකුමාර නානායක්කාර, ඇමති අනුර ප්‍රියදර්ශන යාපා, ඇමති ඩිලාන් පෙරේරා හා මන්ත්‍රීවරුන් ගණනාවකි. එක් ජවිපෙ මන්ත්‍රීවරයෙක් පැවසුවේ මෛත්‍රීපාල සිරිසේන මහතා 26 වෙනිදාට නොවරදවාම හංසයාට ඡන්දය දෙන බවයි.

කට කතා ධාවන තරඟයේ ශූරත්වය හිමිවන්නේ මංගල සමරවීර මැතිතුමාටය. ඔහුගේ ප්‍රකාශ කිහිපයක් කිරා බලමු.

ඇපලෝ රෝහල, දැන් අයිති ගෝඨාභය රාජපක්ෂට. එජාප රජය පුද්ගලික අංශයට රක්ෂණ සංස්ථාව විකුණන ලද්දේ 2003 දීය. වාසුදේව නානායක්කාර මහතා ප්‍රමුඛ පිරිසක් මේ ගනුදෙනුවට විරුද්ධව 2008 දී ශ්‍රේෂ්ඨාධිකරණයට ගියේය. ප්‍රතිඵල වූයේ රක්ෂණ සංස්ථාව යළිත් ජනතා අයිතියට පත් කිරීමය. ඇපලෝ රෝහලේ වැඩි කොටස් හිමිව තිබුණේ රක්ෂණ සංස්ථාවටය. එම සංස්ථාවේ අධ්‍යක්ෂක මණ්ඩලයේ සභාපති පදවිය බාර ගෙන තම දැනුමෙන් උදව් කරන ලෙස ගෝඨාභය රාජපක්ෂ මහතාගෙන් ඉල්ලීමක් කළෝය. යුද්ධයේ බර තරමක් සැහැල්ලු වී ඇති නිසා තාවකාලිකව එම පදවිය බාරගෙන සේවය කිරීමට තමා කැමති බවත් එහෙත් ඒ සඳහා වැටුපක් ලබා නොගන්නා බවත් රාජපක්ෂ මහතා පැවසුවේය.

## මාතර තුරුම්පු

සමරවීර මහතාගේ 'මාතර තුරුම්පු' එතැනින් අවසන් වූයේ නැත. ඔහු ඊළඟට කියා සිටියේ ස්වර්ණවාහිනී මාධ්‍ය ජාලය රාජපක්ෂලා මිලදී ගෙන ඇති බවයි. මේ ප්‍රකාශය ලංකාදීප පත්‍රයේ පළවිය. ඊඒපී එදිරිසිංහ සමූහ ව්‍යාපාරය ප්‍රකාශයක් කරමින් කියා සිටියේ ස්වර්ණවාහිනී මාධ්‍ය ජාලය හොඳින් ලාභ ලබන බවත් එය විකිණීමට තමන් හීනෙකින්වත් සිතා නැති බවත්ය. මේ ප්‍රකාශයද ලංකාදීප පත්‍රයේ පළවිය. සමරවීර මහතා එතැනින් නිශ්ශබ්ද වූයේ නැත. ඔවුන් ඊළඟට පැවසුවේ සියනෑ කෝරළයේ ඔබේසේකර පවුලට අයත් අතිවිශාල බටදොළ නින්දගම රාජපක්ෂලා මිලදී ගෙන ඇති බවයි. එයද ලංකාදීප පුවත්පතේ පළවිය. ඊට ලැබුණු ප්‍රතිචාරය ඉතා තියුණු විය.

## ජනමාධ්‍ය හා ජනාධිපතිවරණය

ඔබේසේකර පවුලේ උරුමක්කාර කාන්තාවන් ලංකාදීපයට ප්‍රකාශයක් කරමින් කීවේ තමන්ගේ දේපළ කිසිවක් විකිණීමට කිසිම අපේක්ෂාවක් නැති බවත්, මෙබඳු අසත්‍ය ප්‍රචාර ගැන තමන් කනගාටු වන බවත්ය. ස්වර්ණවාහිනී හා බටදොළ ගැන ප්‍රකාශ දෙකම අසත්‍ය බව පවසමින් ලැබුණු නිවේදන ලංකාදීප පත්‍රයේ පළ වූයේ එකම දිනයේය. එහෙත් මංගල සමරවීර මහතා ඒ ගැන කනගාටුව පළ කළේ නැත. ඒවා ජනතාවට අමතක වී යනු ඇතැයි සිතූ ඒ මහතා තවත් එබඳු ප්‍රකාශ රාශියක් දිගින් දිගටම කිරීමට සූදානම් වූයේ 'ඕවා මහා ජනයාට නිකම්ම අමතක වී යනු ඇතැයි සිතමින් විය යුතුය.
රාජ්‍ය ජනමාධ්‍ය පිළිබඳව බලවත් උද්ඝෝෂණයක් පැන නැගුනි.
1985 හා 88 ජනාධිපතිවරණවලදී ප්‍රචාරය ක්‍රියාත්මක වූයේ රජයේ විද්‍යුත් මාධ්‍යවලින් පමණී. ඒවා මැතිවරණ දිනය දක්වා සම්පූර්ණයෙන් ම යොදවන ලද්දේ එජාපයේ ජනාධිපති අපේක්ෂකයන් සඳහාය. එසේ වුවද 1994 මහ මැතිවරණය හා ජනාධිපතිවරණයේදී විජේතුංග ජනාධිපතිවරයා රාජ්‍ය මාධ්‍යය තදින් පක්ෂපාතී අන්දමින් පාවිච්චි නොකළේය. 1999 සහ ඊට පසු මැතිවරණ දෙකේ දීද රජයේ මාධ්‍යය යළිත් 82, 88 යුගයේ මෙන් පාවිච්චි කරන ලදී. 2005 ජනාධිපතිවරණයේදී රජයේ මාධ්‍යයෙන් මහින්ද රාජපක්ෂ ජනාධිපති අපේක්ෂකයාට 'හීං කෙඳිරියක් පමණක්' ලබාදීමට චන්ද්‍රිකා කුමාරතුංග

*මීට අවුරුදු 50කට පෙර 1958 සම්මත කරන ලද ඉතා ප්‍රගතිශීලී මැතිවරණ නීති අදටත් වලංගු බව ඇත්තය. එහෙත් විද්‍යුත් හා මුද්‍රිත මාධ්‍යයන්ට ඒ නීතිවලින් රිංගා යෑමට ඇති සිදුරු අපමණය.*

ජනාධිපතිනිය ක්‍රියා කළේ මන්දැයි දැන් දැන් පැහැදිලි වී ඇත.

## මාධ්‍ය ජාල

එහෙත් මෙවර තත්ත්වය කුමක්ද? වෙන කවරදාවත් නොතිබූ තරම් මාධ්‍ය ජාල රාශියක් අද ජනතාව අතර සැරිසරයි. සමහරක් රජයේ මාධ්‍ය ජාලයන් වෙයි. තවත් කිහිපයක් දැඩි රාජ්‍ය විරෝධී මාධ්‍යයන් වෙයි. තවත් ස්වල්පයක් මධ්‍යස්ථ මාවත අනුගමනය කරයි. මැතිවරණ කොමසාරිස්වරයා මුලින්ම කියා සිටියේ රජයේ මාධ්‍ය පමණක් පාලනය කරමින් රජයට පසමිතුරු මාධ්‍යයන් නිදැල්ලේ හැරීම අසාධාරණ බවය.
මීට අවුරුදු 50කට පෙර 1958 සම්මත කරන ලද ඉතා ප්‍රගතිශීලී මැතිවරණ නීති අදටත් වලංගු බව ඇත්තය. එහෙත් විද්‍යුත් හා මුද්‍රිත මාධ්‍යයන්ට ඒ නීතිවලින් රිංගා යෑමට ඇති සිදුරු අපමණය. රජයේ මාධ්‍ය ආයතන මෙන්ම රජයට පස මිතුරු මුද්‍රිත හා විද්‍යුත් ජාලයන් ද මේ සිදුරුවලින් උපරිම ප්‍රයෝජනය ගන්නා බ වමට පැහැදිලි වූ සත්‍යයයි.

මගේ හැඟීම නම් මේ මාධ්‍ය ප්‍රචාරයෙන් ජනතාවගේ චින්තනයේ එතරම් වෙනසක් සිදු නොවූ බවය.
මීට පෙර සෑම මැතිවරණයකදී මෙන්ම ප්‍රධාන දේශපාලන ප්‍රවාහයන් දෙකට පෙළ ගැසුණු ඡන්දදායකයෝ ඒ අනුව ඡන්දය ප්‍රකාශ කළහ. එහෙත් විශාලම කොටස වූ මධ්‍යස්ත ඡන්දදායක පිරිස? ඔවුන්ට තීරණය කරන්නට සිදු වූයේ යුද ජයග්‍රහණයේ